**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,112,907 ක් අඩුවෙන් හා ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි රු.219,778 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධනිත කළයුතු වටිනාකම රු.74,500 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, ප්‍රාග්ධනිත කළ නොහැකි වටිනාකම රු.51,890 ක අමතර කොටස් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.12,702,185 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.13,135,635 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පැරණි ලේඛන පරීක්ෂා කර ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | නිකුත් කරන ලද වටිනාකම රු.1,498,152 ක් වූ චෙක්පත් 26 ක් භාරගත් පාර්ශවයන්ගේ | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 388 හා 389 | තොරතුරු ලේඛන ගතකර නොතිබුණි. | |

### 1.7.2 අධිකාරි බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම සඳහා සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, ඉන්ධන වෙනුවෙන් රු.800,139 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව කටයුතු කළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,020,062 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,352,864 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,168,798 | 4,741,920 | 5,108,424 | 5,620,998 | 3,578,798 | 2,955,934 | 3,219,079 | 5,987,502 |
| කුලී | 8,910,350 | 6,659,850 | 9,887,267 | 4,306,404 | 7,893,230 | 6,481,989 | 7,548,540 | 7,533,821 |
| බලපත්‍ර ගාස්තු | 450,100 | 422,597 | 398,597 | 149,350 | 400,100 | 172,935 | 172,935 | 125,350 |
| වෙනත් ආදායම් | 11,883,000 | 8,463,326 | 8,460,326 | 48,192 | 8,376,600 | 7,868,597 | 7,868,597 | 45,192 |
| එකතුව | 25,412,248 | 20,287,693 | 23,854,614 | 10,124,944 | 20,248,728 | 17,479,455 | 18,809,151 | 13,691,865 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවියයුතු මුළු ආදායම රු.13,691,865 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.10,124,944 ක් විය. 2023 වර්ෂය සඳහා කිසිදු වරිපනම් බදු මුදලක් නොගෙවූ ඒකක 1127 ක් පැවති අතර, එම ඒකක වලින් අය වියයුතු හිඟ වරිපනම් ශේෂය රු.3,817,535 ක් විය | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ග්‍රාම නිලධාරී වසම් 40 ක් පැවති අතර, ඉන් ග්‍රාම නිලධාරී වසම් 37 කින් ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්ති ප්‍රකාරව දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන බදු පැනවිය යුතුය. |
| (ඇ) | වරිපනම් බදු තක්සේරුව 2008 වර්ෂයේ සිදුකර තිබුණු අතර, නව තක්සේරුවක් සිදු නොකිරීමෙන් සභාවට උපයාගත හැකි ආදායම් අහිමි වීමක් සිදු වී තිබුණි තිබුණි. | තක්සේරු වාර්තාව ලද වහාම ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. | වර්තමාන වටිනාකම් තක්සේරු කර ආදායම් අය කල යුතුය. |
| (ඈ) | මහජ්දණ්ඩ පොළ භූමියේ අංක 17 කඩ කාමරය 2018 ජූලි මස සිටම බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු.83,700 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | ටෙන්ඩර් කිරීමට කටයුතුකරන බව. | කඩ කාමර ටෙන්ඩර් කර බදු අය කල යුතුය. |
| (ඉ) | සභාව සතු කඩ කාමර 02 කින් 2013 වර්ෂයට පෙර සිට රු.295,368 ක මුදලක් හිඟව පැවති අතර, කඩ කාමර 122 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | 2015 වර්ෂයේ දී කඩ තක්සේරු කර තිබූ අතර, කඩ කාමර 198 ක තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු නොකිරීමෙන් ලැබිය යුතු කුලී ආදායම් සභාවට අහිමි වී තිබුණි. | තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව. | කඩකාමරවල වර්තමාන වටිනාකම තක්සේරු කර ආදායම් අයකල යුතුය. |
| (උ) | සවිකර ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 158 ක් වෙනුවෙන් රු.1,114,950 ක ගාස්තුවක් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඌ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.325,000 ක් හා මුද්දර ගාස්තු රු.9,332,054 ක් විය. | මුද්දර ගාස්තු රු.2,238,138ක් අයවීමට ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද අනවසර ඉදිකිරීම් 04 කට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම හෝ ආවරණ අනුමැතිය ලබාදිය හැකි ගොඩනැගිලි සම්බන්ධව රු.2,580,000 ක ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබා දීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින්ගෙන් හිඟ ජල ගාස්තු රු.1,148,760 ක් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ජල මීටර් 139 ක් අක්‍රීය වී පැවතුණි. | හිඟ බිල්පත් මුදලින් 50%ක් අයකර ගත හැකි බවත්,අක්‍රිය ජල මනු නැවත සවි කිරීමට ක්‍රියා කරන බව. | ජල මීටර් ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේ දී ඉදිකර තිබුණු අතර, කුරුඳුගහ හැතැම්ම පිහිටි අඩක් නිම වූ ගොඩනැගිල්ල වසර 20 ට අධික කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා තලාද තට්ටුව (slab) තෙතමනයට ලක් වී කොන්ක්‍රීට් දුර්වල වීමේ අවධානමක් පැවති අතර, වසර 20 ට අධික කාලයක සිට අඩක් නිමකර ඇති මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රධාන ඉංජිනේරුතුමා වෙතින් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 09 ත් වසර 35 ත් අතර කාලයක සිට පැවත එන සේවක ණය රු.166,140 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |